


**ගොවි මහතුනි, වගාකරුවනි,** ශ්‍රී ලංකාවේ **4වන** වැවිලි භෝගය ලෙස රජය මඟින් ප්‍රකාශයට පත්කර ඇති, වර්තමාන කර්මාන්ත ක්ෂේත්‍රයේ අති විශාල ඉල්ලුමක් පවතින **ගිනිසීරියා (ග්ලිරිසීඩියා) ශාඛය** ඔබත් අතුරු භෝගයක් ලෙස වගාකර සරුසාර අමතර ආදායමක් ලබා ගන්න.

- ✔ ගිනිසීරියා අතුරු භෝගයක් ලෙස වගා කිරීමට වැයවන මුදල් හා ශ්‍රමය ඉතා අවමයි
- ✔ සරු අමතර ආදායමක් ලබාදෙන අතරම පරිසරයටත් රටටත් අමතර ප්‍රයෝජන රැසක් !

**ගිනිසීරියා හෙක්ටයාරයක් අතුරු භෝගයක් ලෙස වගාකිරීමෙන් වසරකදී ලැබෙන ප්‍රතිඵල**

- ශාඛ පත්‍ර ටොන් 26ක්
- ඉන්ධන දැව ටොන් 30ක්

### ගිනිසීරියා පත්‍ර වටිනා ස්වාභාවික කාබනික පොහොර වර්ගයකි

ගිනිසීරියා පත්‍ර පසෙහි සරුබව ඉහළ නංවන ඉතා හොඳ කාබනික පොහොර වර්ගයක් බැවින් රසායනික පොහොර සඳහා වැයවන අතිවිශාල මුදල් ප්‍රමාණයක් ඉතිරිකරගත හැකිවේ.



### කදිම සත්ත්ව ආහාරයකි

ගිනිසීරියා කොළ පෝෂ්‍යදායී සත්ත්ව ආහාරයකි. පොහොර සමඟ සම සමව කිරි ගවයින් සඳහා ප්‍රධාන ආහාරය ලෙස යොදාගත හැකිය. කිරි එළදෙනුන් 6කට අවශ්‍ය සත්ව ආහාර හෙක්ටයාර 1ක වගාවකින් ලබාගත හැකිය.



### බලශක්ති අර්බුදයට දේශීය විසඳුමක් සපයයි

ගිනිසීරියා ස්වාභාවික බලශක්ති මූලයක් වන බැවින් ඉන් ලැබෙන දැව ඉන්ධන බලශක්ති අර්බුදයට පරිසර හිතකාමී විසඳුමක් සපයන අතරම ආනයනික ඉන්ධන සඳහා වැයවන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටට ඉතිරි කරදෙයි.



**වසරකට ගස් 8000 කින් රු 500,000 කට වඩා වැඩි ආදායමක්**

*ඔබත් ගිනිසීරියා වගාකොට දේශීය ආර්ථික පුනර්ජීවනයක ප්‍රතිලාභ අත්විඳින්න*

ශ්‍රී ලංකා ජීව බලශක්ති සංගමය
277, නව හුණුපිටිය පාර, දළුගම, කැලණිය
ඊ-මේල්: bioenergyasl@gmail.com වෙබ: www.bioenergysrilanka.lk
දුරකථනය: 011 290 7831 ෆැක්ස්: 011 290 5196